## මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# පුනරුත්ථාපන කාර්යාංශය

# පුරප්පාඩු

**පුනරුත්ථාපන කාර්යාංශයේ සහ ඒ යටතේ ස්ථාපිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි පහත සඳහන් වෘත්තීන්ට අදාළව පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| රියදුරු - (PL 3) | - 12 |
| ජලනල කාර්මික/ ජල මෝටර් ක්‍රියාකරු - (PL 3) | - 03 |
| විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු - (PL 3) | - 03 |
| අරක්කැමි - (PL 2) | - 05 |
| කරණවෑමි - (PL 2) | - 01 |
| කාර්යාල කාර්ය සහායක - (PL 1) | - 02 |

ඉහත සඳහන් තනතුරුහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2026.08.03 සිට 2026.08.17 වන දින දක්වා දීර්ඝ කර ඇත.

ඉහත එක් එක් තනතුරුවලට අදාලව වෘත්තීය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

අයදුම්පත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාල අධ්‍යාපන සහතිකපත්හි සහතික කළ පිටපත් ඇතුලත් කිරීම අනිවාර්ය වන අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත බාගත කර ගැනීම සහ වැඩි විස්තර සඳහා **https://www.bor.gov.lk/careers/** වෙබ් පිටුව වෙත පිවිසෙන්න.

**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්,**
**පුනරුත්ථාපන කාර්යාංශය,**
**අංක 462/2, කඩුවෙල පාර,**
**ගනහේන, බත්තරමුල්ල,**

**1.** **තනතුර - රියදුරු**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වීම.

**(ආ) ප්‍රවීණතා (පහත i සහ ii අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුයි)**

i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

ii. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i සහ ii අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුයි)**

i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

ii. ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00+17800.00x12 = රු. 703,608.00 (2026)

43,280.00+17800.00x12 = රු. 732,960.00 (2027)

5. **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි රාජකාරි අවශ්‍යතාවයන් සඳහා ප්‍රවාහන සේවා ලබාදීම.

ii. පුනරුත්ථාපනලාභින්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා, නඩු වාරයන් වලදි බන්ධනාගාර වෙත/ උසාවි වෙත රැගෙන යාම සඳහා, ළගම ඥාතීන්ගේ අවමංගල්‍ය උත්සව සඳහා සහභාගි කරවීම සඳහා, උසාවි නියෝග මගින් ලබාදෙන වෙනත් අවශ්‍යතාවයන් සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

iii. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි අවශ්‍යතාවය මත බාහිර සම්පත්දායකයින් සඳහා අවැසි ප්‍රවාහන පහසුකම් සැලසීම.

iv. කාර්ය මණ්ඩල සමාජිකයන්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

v. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ආහාරපාන, දේපළ හා උපකරණ ප්‍රවාහනය කිරීම.

vi. රථ වාහන නිසි පරිදි නඩත්තු කිරීම, ධාවන වාර්තා (පොදු 268) සටහන් කිරීම. ආරක්ෂිත රිය ධාවනය, මාර්ග ධාවන නීති පිළිපැදීම.

vii. කල් ඉකුත් නොවූ රියදුරු බලපත්‍රයක් තිබීම හා අවැසි අවස්ථාවන්හිදි රියදුරු බලපත්‍රය යාවත්කාලීන කර ගැනීම.

viii. ධාවන වාර්තා (පොදු 268) සටහන් පොතෙහි සඳහන්ව ඇති උපදෙස් පිලිපැදිම.

**1.** **තනතුර - ජලනල කාර්මික/ ජල මෝටර් ක්‍රියාකරු**

**2.** **වයස -** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

i. ජලනල කාර්මික/ජල මෝටර් ක්‍රියාකරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් සුදුසුකම් වලින් 2න් එකක් සපුරා තිබිය යුතුය.)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. ජලනල කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. නතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00 + 17800.00 x 12 = රු.703,608.00(2026)

43,280.00 + 17800.00 x 12= රු.732,960.00(2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සඳහා සුදුසු ජල නල පද්ධති ස්ථාපනය කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු පිළිබඳ සොයා බලා කටයුතු කිරීම.

ii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් ආසන්නයෙහි පිහිටි පාවච්චයට සුදුසු ජල මූලාශ්‍ර ඇත්තම් කාර්යාංශ උපදෙස් මත සවි කරනු ලබන ජලය පොම්ප කරනු ලබන යන්ත්‍ර ඇත්තම් ඒවා පිළිබඳ සොයා බලා නඩත්තු කිරීම.

iii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ජල නල පද්ධතින්ගේ අලුත්වැඩියාවන් ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ යොදා නිවැරදිව සිදු කිරීම.

**1.** **තනතුර - විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

i. විදුලි කාර්මික ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්(පහත සුදුසුකම් වලින් 2 න් එකක් සපුරා තිබිය යුතුයි)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. විදුලි කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2 ) ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00 + 17800.00 x12 = රු. 703,608.00 (2026)

43,280.00 + 17800.00 x12 = රු. 732,960.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ගොඩනැගිලි වල සියලුම විද්‍යුත් පරිපථයන්හි අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සිදුකිරීම.

ii. නිවැරදි නිර්ණායකයන්ට අනුව නව විදුලි උපාංග හා පරිපථ ස්ථාපනය කිරීම

iii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්ට අයත් හා බාහිර ආයතන මගින් ලබා ගන්නා විදුලි ජනක යන්ත්‍ර ආරක්ෂාරීව ක්‍රියා කරවීම හා නඩත්තුව.

iv. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ආරක්ෂක විදුලි පහන් හා විදුලි වැට හදිසි බිඳ වැටීමකට ලක් නොවන අයුරින් පවත්වා ගෙන යාම හා ඒ සඳහා ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග පෙර පුහුණු වීම් කර සූදානමින් සිටීම.

v. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි හදිසි විදුලිය බිඳ වැටීමක් සිදු වුවහොත් ක්ෂණිකව එය හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රියාත්මක වීම.

vi. ජාතික විදුලි බල පද්ධතිය මගින් ලබාදෙන විදුලියෙහි බිඳ වැටීමක් සිදු වුවහොත් ආරක්ෂිත වැට / පිරික්සුම් ලාම්පු ක්ෂණිකව ජනක යන්ත්‍ර මගින් පණ ගැන්වීම සඳහා ක්‍රියා කිරීම.

vii. අනවසර අයුරින් විදුලිය පාවිච්චි කිරීමට හැකි සියලුම මංපෙත් අසුරාලීමට අවැසි ක්‍රියා මාර්ග ගත යුතුය.

viii. ජාතික අවශ්‍යතාවයක් වන විදුලිය අරපිරිමැස්ම පිළිබඳව මනා අවබෝධයකින් ක්‍රියා කළ යුතුය.

**1. තනතුර - අරක්කැමි**

**2. වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3. සුදුසුකම්**

**අ. බාහිර අයදුම්කරුවන්**

i. අරක්කැමි තනතුරෙහි කාර්භාරයට අදාළව අරක්කැම් ක්ෂේත්‍රයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමක නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් සුදුසුකම් වලින් 2න් එකක් සපුරා තිබිය යුතුය)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාල වේ.

ii. අරක්කැමි ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්භාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටම නොඅඩු මට්මක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL1) සේවා ගණයක සේවකයින්

**ඇ. වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4. වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 2- 2025

මූලික වැටුප - රු. 40,008.00 (2026), රු. 42,300.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,008.00+17800.00 x 12 = රු. 693,696.00 (2026)

42,300.00 +17800.00 x 12 = රු. 721,200.00 (2027)

**5. රාජකාරී ස්වභාවය**

i. පුනරුත්ථාපනලාභීන්ගේ හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දෛනික ආහාර පාන පෝෂණ ගුණය රැකෙන පරිදි විවිධත්වයකින් යුක්තව සකස් කිරීම හා ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම.

ii. මුලුතැන්ගෙයි උපකරණ හා උපාංග පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත අන්දමින් පවත්වා ගෙන යාම හා තම පෞද්ගලික පිරිසිදුතාවය/ සෞඛ්‍ය තත්ත්වය ඉතා උසස් මට්ටමින් පවත්වාගෙන යාම.

iii. පාවිච්චියට නුසුදුසු ආහාර පොත /උපකරණ පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ව ක්ෂණිකව දැනුවත් කිරීම.

iv. ආහාර සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය / උපකරණ නිසි පරිදි ඉල්ලුම් කිරීම.

v. නාස්තිය අවම වන මට්ටමින් ආහාර පාන සැකසීම.

**1.** **තනතුර - කරණවැමි**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

i. කරණවැමි තනතුරෙහි කාර්භාරයට අදාළව කරණවැමි ක්ෂේත්‍රයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමක නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සදහන් සුදුසුකම් වලින් 02න් එකක් සපුරා තිබිය යුතුයි)**

i. ඉහත සදහන් භාහිර අයදුම්කරුවන් සදහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. කරණවැම් ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්භාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නො අඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 2- 2025

මූලික වැටුප - රු. 40,008.00 (2026), රු. 42,300.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,008.00 +17800x12 = රු. 693,696.00 (2026)

42,300.00 + 17800 x12= රු.721,200.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. පුනරුත්ථාපනලාභින්ගේ හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කරණවැමි සේවා කටයුතු සිදු කිරීම.

ii. කරණවැම්හල හා කරණවැමි උපකරණ ආරක්ෂිතව හා පිරිසිදුව පවත්වාගෙන යාම.

**1.** **තනතුර - කාර්යාල කාර්ය සහයක**

2. **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අ. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙල විභාගයට පෙනී සිටීම.

**ආ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 1- 2025

මූලික වැටුප - රු.38,488.00 (2026), රු.40,500.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 38,488.00 +17800.00x12 = රු 675,456.00 (2026)

40,500.00 +17800.00x12 = රු 699,600.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි සම්පූර්ණ පවිත්‍රතාවය පිළිබඳව සොයා බලා කටයුතු කිරීම.

ii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි නඩත්තු කරනු ලබන ලිපිගොනු / ලිපි ලේඛන වල රහස්‍යභාවය සුරැකීම හා ලිපිගොනු ආරක්ෂාකාරීව පවත්වා ගෙන යාමට සහාය වීම.

iii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි දෛනික තැපෑල නිසි පරිදි පවත්වාගෙන යාම.

iv. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන පරිශ්‍රයන්හි ඇති වත්කම් දේපල ආරක්‍ෂාකාරීව පවත්වා ගෙන යාමට සහාය වීම.

v. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රි යාත්මක වන ආයතනයන්හි අංශ අතර ලිපිගොනු ලිපිලේඛන අවශ්‍ය පරිදි කඩිනමින් නිවැරදිව හුවමාරු කිරීම.

vi. අවශ්‍යතාවය මත බාහිර පාර්ශවයන් වෙත ලිපිගොනු ලිපිලේඛන අවශ්‍ය පරිදි කඩිනමින් නිවැරදිව හුවමාරු කිරීම.

vii. ලේඛණාගාරය සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා සහය වීම.

viii. අවශ්‍යතාවය අනුව පවරනු ලබන වෙනත් රාජකාරී මැනවින් ඉටු කිරීම.